# දළඳා වහන්සේගේ ආරක්ෂාව උදෙසා වේලෛක්කාරවරුන් විසින් අනුගමනය කළ ක්‍රියාමාර්ග පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (වේලෛක්කාර ශිලා ලේඛනය ඇසුරින්)

**කුමාරවංශ ඩබ්ලිව්.එච්.ඩී.එම්,[1] නවෝද්‍යා පී.එන්,[2] ඒකනායක එච්.එම්.එන්.එම්.[3]**

අතීත ලංකාවේ රාජ්‍යත්වය තහවුරු කිරීම කෙරෙහි ප්‍රබල සාධයක් වූයේ දළඳා වහන්සේ ය. පොළොන්නරුව් පැවති ව්‍යාකූල දේශපාලන පරිසරය මධ්‍යයේ දළඳා වහන්සේ තැන්පත් කර තිබූ දළඳා මාළිගාව ආරක්ෂා කිරීම සඳහා වේලෛක්කාර සේනාවට භාර කළ බව මූලාශ්‍රයවල සඳහන් ය. වේලෛක්කාර්වරුන් විසින් දළඳා වහන්සේ ආරක්ෂා කිරීමට අනුගමනය කළ ක්‍රියාමාර්ගයන්ගේ ස්වරූපය පිළිබඳව හඳුනාගැනීම මෙහි අරමුණ වේ. අධ්‍යයන ක්‍රමවේදය ලෙස අන්තර්ජාලයෙන් හා පුස්තකාල පරිශීලනය මගින් ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍රය භාවිතා කර ඇත. වේලෛක්කාර්වරුන් පිළිබඳ පැරණිතම සාධකය හමු වන්නේ ක්‍රිෘව 9 වන සියවසේ හතරවන කාශ්‍යප රජුගේ කාලයට අයත් ඔහුගේ ශිලා ලේඛනයක ය. එහි 'වේළක්කා' නැමැත්තෙකු පිළිබඳව විස්තර හමු වී ඇත. වේලෛක්කාර්වරු දකුණු ඉන්දියානු රාජ්‍යවල වෙළඳ ශ්‍රේණි සඳහා සේවය කළ ප්‍රබල හමුදාවකි. විජයබාහු රජුගේ අණ පරිදි දේව නම් සේනාපතියෙකු විසින් පෙළොන්නරුවේ තනවා ඇති දන්ත ධාතු මන්දිරය වේලෛක්කාරයන් විසින් ආරක්ෂා කළ බව වේලෛක්කාර දමිළ අභිලේඛනයේ සඳහන් ය. උත්තර මූලයේ මොග්ගල්ලාන හිමියන් දළඳාව හා පාදාව තැන්පත් කර ඇති ශුද්ධ වූ දළඳා මාළිගයත් ඊට අයත් දේපළත් ආරක්ෂා කිරීම සඳහා වේලෛක්කාරයන්ට පැවරූ බව මෙම අභිලේඛනයේ දක්වා ඇත. එහි දී දන්තධාතු මන්දිරයට 'මුන්රූ කයිත්තිරු වේලෛක්කාරයන් දළඳායිප්පේ පෙරුම්පල්ලි' යන ශුද්ධ නාමය ලබාදුන් බව ද සඳහන් ය. දළඳා මාළිගාව ආරක්ෂා කිරීම පමණක් නොව දළඳා මාළිගාවට අයත් ගබඩාගම්, ගම්වැසියන්, සේවකයන් ඇතුළුව සියළු දේපළ ආරක්ෂා කිරීමට ද එම වේලෛක්කාර්වරු බැඳී සිට ඇත. මෙම අභිලේඛනයෙන් දළඳා මාළිගයට ආරවුලක් කළහොත් එසේ කිරීම වේලෛක්කාර සේනාවට, මහා ස්ථවීරයන්ට හා බුද්ධ ශාසනයට කරනු ලබන වරදක් වශයෙන් පාලකයන් දක්වන ලද බව සඳහන් ය. මෙම අභිලේඛනය දෙමළ කතා කළ වේලෛක්කාර ජන සමූහයා සමඟ ඇති කරගත් ගිවිසුමක් බව නන්දසේන මුදියන්සේ මහතාගේ ද්‍රවිඩ සිහිවටනය යන කෘතියේ සඳහන් කර ඇත. දළඳා මාළිගයෙහි ආරක්ෂාවට වේලෛක්කාර්වරුන් විසින් වළංකයි හා පරිවාරක්කෝන්තම් යන හමුදා ඒකක අටට ලබා දී ඇත්තේ නිශ්චිත කාලසටහනකට අනුව බව සඳහන් ය. මේ ආකාරයට මෙරට බෞද්ධයින්ගේ මුදුන්මල්කඩ වූ දළඳා වහන්සේ ආරක්ෂා කිරීම උදෙසා වේලෛක්කාර්වරුන් කැප වී ක්‍රියා කළ බව වේලෛක්කාර අභිලේඛනය තුළින් හඳුනාගත හැකි ය.

**ප්‍රමුඛ පදඃ** ආරක්ෂාව, ක්‍රියාමාර්ග, දළඳා මාළිගය, ශාසනය, වේලෛක්කාර්වරු

[1]ඉතිහාසය අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. whdeepthi@gmail.com